සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

## (01) මූල්‍ය ක්‍රම

පැ දෙකයි

ප්‍රශ්න හතරකට **පමණක්** පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

**1.** (i) මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන වොරන්ට් බලපත්‍ර වර්ග **පහක්** නම් කර, ඒවා එකිනෙකෙහි අරමුණ සඳහන් කරන්න.

(ii) මුදල් රෙගුලාසිවල සඳහන් පරිදි ජනාධිපතිවරයාට ඒකාබද්ධ අරමුදලින් මුදල් නිදහස් කිරීමට බලය දී ඇති අවස්ථා දෙක කෙටියෙන් විස්තර කරන්න.

**2.** (i) මුදල් රෙගුලාසි අනුව දෙපාර්තමේන්තුවක ගිණුම් අංශයේ ගෙවීම් කටයුතු අවසන් කරන ලද වවුචර්පත් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පියවර මොනවා ද?

(ii) විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් අධිකාරී බලය පැවරූ නිලධාරියකුට තම විගණන කාර්ය ඉටු කිරීමේදී යොදා ගත හැකි බලතල මොනවා ද?

**3.** රජයේ දෙපාර්තමේන්තුවක මු.රෙ. 137 යටතේ වවුචර් අනුමත කිරීමේ (approving) බලය හිමි නිලධාරියකු ලෙස ඔබ විසින් ගණන්දීමේ නිලධාරියාට වගකිව යුතු කරුණු මොනවා ද?

**4.** (i) රජයේ ගිණුම පිට ලියනු ලබන චෙක්පතකට දෙවැනි අත්සන තබන නිලධාරියා විසින් ගණන්දීමේ නිලධාරියාට වගකිව යුතු කරුණු මොනවා ද?

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව භාණ්ඩ හා සේවා මෙන්ම ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් ප්‍රසම්පාදනයේ දී යොදා ගත හැකි මිලදී ගැනීම් ක්‍රම **පහක්** සඳහන් කරන්න.

**5.** (i) ගණන්දීමේ නිලධාරියකු විසින් අතුරු අග්‍රිම ලබා දෙන අවස්ථා කෙටියෙන් විස්තර කරන්න.

(ii) මු.රෙ. 128 අනුව ගණන්දීමේ නිලධාරියකු රජයේ රාජකාරී කටයුතු ඉටු කිරීමේදී රජය විසින් අපේක්ෂා කරනු ලබන ගුණාංග මොනවා ද?

**6.** පහත සඳහන් මාතෘකා අතුරින් **පහක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ලංසු ඇපකරය

(ii) ගබඩා භාරකරු

(iii) ඒකාබද්ධ අරමුදල

(iv) විසර්ජන ගිණුම

(v) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

(vi) පුනරාවර්තන වියදම්

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

**(02) පරිපාලනය**

පැ දෙකයි

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

**I කොටස**

1. (i) පංචවිධ සංකල්පය රජයේ කාර්යාලයක් තුළ ක්‍රියාත්මක කිරීමෙන් එම කාර්යාලයේ ඵලදායිතාවයට සිදුවන බලපෑම පැහැදිලි කරන්න.
   (ii) ඵලදායිතා වර්ධන කවයක් යනු කුමක් දැයි හඳුන්වා එම කවයක් තුළින් පරිපාලනයට අත්වන ප්‍රයෝජන මොනවා දැයි එකිනෙක සඳහන් කරන්න.

2. රේඛීය සංවිධානයක් යනු කුමක් දැයි පැහැදිලි කර එවැනි සංවිධාන ක්‍රමයක් රජයේ කාර්යාලයකට යොදා ගැනීමෙන් ලබා ගත හැකි වාසි හා අවාසි මොනවා දැයි සඳහන් කරන්න.

3. පහත සඳහන් මාතෘකා කෙටියෙන් පැහැදිලි කරන්න.
   (i) ඇමතුම් දිනපොත
   (ii) සංවිධාන සටහන
   (iii) චලන පත්‍ර
   (iv) විෂය ලිපිගොනු
   (v) විවෘත පිරිසැකැස්ම

**II කොටස**

4. කාර්ය පරිපාටික රීති ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභිනියෝජනය කරන ලද බලය ක්‍රියාත්මක කරනු ලබන බලධරයකුට කළ හැකි පත්කිරීම් මොනවා ද?
   (ii) පත්කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි මොනවා ද?

5. (i) වරප්‍රසාදයක් වශයෙන් රජයේ නිලධාරියකුට ලැබෙන අනියම් හා විවේක නිවාඩු සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
   (ii) රාජකාරි ලිපි ලේඛනවල භාරය, ඒවා ආරක්‍ෂාකර තබා ගැනීම හා විනාශකර දැමීම යටතේ දක්වා ඇති විනාශ නොකළ යුතු ලේඛන මොනවා දැයි සඳහන් කරන්න.

6. ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදය යටතේ දක්වා ඇති පහත සඳහන් අවස්ථා පැහැදිලි කරන්න.
   (i) මුදල් දූෂ්කරතා
   (ii) සාමාන්‍ය හැසිරීම

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

### (03) දෙපාර්තමේන්තු රෙගුලාසි I

පැ දෙකයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

**1.** (i) එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක සිට තවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ගවයින් ප්‍රවාහනය කිරීමේ දී අනුගමනය කළයුතු ක්‍රියාපිළිවෙළ විස්තර කරන්න. *(ලකුණු 15 යි)*

(ii) සතුන් ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා වාහනයක තිබිය යුතු ප්‍රමිති සැකෙවින් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

**2.** පහත සඳහන් දේ පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) සතුන් හංවඩු ගැසීම

(ii) සත්ත්ව සුරැකුම් මධ්‍යස්ථාන

(iii) ගව වවුචරය

(iv) ගව ලේඛනය

(v) 1988 අංක 46 දරන සත්ත්ව පනත (සංශෝධන) මගින් රජයේ පශු වෛද්‍ය නිලධාරියකුට පවරා ඇති බලතල

*(ලකුණු 05 × 5 = 25 යි)*

**3.** (i) කිරි ගව ගොවිපොළක ගවයින් කුර හා මුඛ රෝග ලක්ෂණ පෙන්නුම් කරයි නම්, එම ගොවිපොළ පිහිටි ප්‍රදේශය භාර පශු වෛද්‍ය නිලධාරි විසින් ගතයුතු ක්‍රියාමාර්ග මොනවා ද? *(ලකුණු 15 යි)*

(ii) ගව උමතු රෝගය (Bovine spongifoarm encephalopathy) ඇති කරන රෝග කාරකය ශ්‍රී ලංකාව තුළට ඇතුළුවීම වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සැකෙවින් දක්වන්න. *(ලකුණු 10 යි)*

**4.** (i) පශු ඖෂධ හා පශු ජෛව නිෂ්පාදන ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දී එහි ප්‍රමිතිය නියාමනය කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සැලසී ඇති පනත නම් කර, එමගින් බලය පවරා ඇති ආයතන මොනවා දැයි හෝ නිලධාරීන් කවුරුන් දැයි හෝ පැහැදිලි කරන්න.

(ii) අංක 1/292 හා 2003.06.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආහාර පිණිස යොදාගන්නා සතුනට දීමට තහනම් කර ඇති ප්‍රතිජීවක ඖෂධ නම් කරන්න.

(iii) 1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනතේ සඳහන්ව ඇති, සත්ත්ව ආහාරවලට යෙදිය හැකි වර්ධන උත්තේජක ප්‍රතිජීවක නම් කරන්න.

(iv) අනුමත සත්ත්ව ආහාර පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

(v) 1986 අංක 15 දරන සත්ත්ව ආහාර පනතේ විධිවිධානවලට අනුව පත් කරනු ලබන බලලත් නිලධාරියකුගේ බලතල සැකෙවින් ලියන්න.

*(ලකුණු 05 × 5 = 25 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

## (04) දෙපාර්තමේන්තු රෙගුලාසි - II

පැය තුනයි

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

1. (i) කුර හා මුඛ රෝගය (Foot and Mouth disease) පිළිබඳව පැහැදිලි කරන්න.
   (ii) මෙම රෝගය සම්ප්‍රේෂණය වන්නේ කෙසේ ද?
   (iii) මෙම රෝගය වළක්වාගන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

2. (i) ශ්‍රී ලංකාවේ සිටින එළ ගවයන්ට හා මී ගවයන්ට ස්පර්ශයෙන් බෝවන රෝග (contagious diseases) මොනවා ද?
   (ii) එම රෝග ව්‍යාප්තවීම වළක්වා ගැනීමට ගත යුතු පියවර මොනවා ද?

3. (i) 'ආහාර සෞඛ්‍යාරක්ෂිතතාව (food safety)' යනු කුමක් ද?
   (ii) පිරිසිදු කිරි නිෂ්පාදන සංකල්පය යන්න පැහැදිලි කර, මහා පරිමාණ ගොවිපොළ ගව කළමනාකරණ පද්ධතියක් (mega farm herd management system) තුළ පිරිසිදු කිරි නිෂ්පාදනයට ඇති ප්‍රායෝගික ගැටලු පැහැදිලි කරන්න.
   (iii) ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය සම්බන්ධව කිරි සෞඛ්‍යාරක්ෂිතතාව හා සනීපාරක්ෂක කටයුතුවල වැදගත්කම සාකච්ඡා කරන්න.

4. (i) 'කෘත්‍රිම සිංචනය (artificial insemination)' යනු කුමක් ද?
   (ii) ශ්‍රී ලංකාවේ කිරි ගවයින් ප්‍රවේණිකව වැඩි දියුණු කිරීමේ දී කෘත්‍රිම සිංචනයෙහි ප්‍රයෝජනය කුමක් ද?
   (iii) කෘත්‍රිම සිංචන ක්‍රියාවලියට අදාළව ශ්‍රී ලංකාවේ රජය විසින් සම්පාදනය කළ පනත් ලැයිස්තු ගත කරන්න.

5. පහත සඳහන් මාතෘකා අතුරින් හතරක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (i) ගවයන් සඳහා අධිශීතකරණය කළ ශුක්‍රාණු (defrozen semen) භාවිත කරන කෘත්‍රිම සිංචන ක්‍රියාවලිය
   (ii) අනුමත සත්ත්ව ආහාර
   (iii) මහජන සෞඛ්‍යයට මාංශ පරීක්ෂාවේ ඇති වැදගත්කම
   (iv) ශ්‍රී ලංකාවේ ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මී ගවයන්ගේ වැදගත්කම
   (v) ක්ෂීර තත්ත්ව දර්ශකයක් ලෙස දෛහික සෛල ගණනය (somatic cell count) හි ප්‍රයෝජන

* * *